## පාඩම :- තෝරා ගත් භාණ්ඩයන්හි ගී අනුවාදන හා ඒවායේ ස්වභාවය

- ගී අනුවාදනයක් යනු,

ගීතයක තනුව (Melody) ස්වර වාද්‍ය භාණ්ඩයකින් හෝ තබ්ලා තරංග, ජල තරංග, වැනි භාණ්ඩ වලින් වාදනය කිරීමයි

- ගී අනුවාදන වල සුවිශේෂී ලක්ෂණ.

1. ගීතයේ තනුව තෝරා ගත් ප්‍රධාන භාණ්ඩයකින් වැයීම.

   උදා:- වයලීනය, බටනළාව, සිතාරය

2. ගීතයක් වාදනය කිරීමේ දී එම ගීතය හඳුන්වා දීමේ වාදන Introduction, අතුරු වාදන Interlude, කොටස් හා නියමිත පරිදි භාණ්ඩ යොදා වාදනය කිරීම ද කැපී පෙනේ.
3. වාදකයාගේ දක්ෂතාවය මත ගී අනුවාදනය සාර්ථකවීම

ගී අනුවාදන ඉදිරිපත් කර ඇති ලාංකේය ප්‍රවීන වාද්‍ය ශිල්පීන්.

**වී. හේමපාල පෙරේරා මහතා - බටනළා**



**ඩී.ඩී.ගුණසේන මහතා - වයලින්**



**ප්‍රදීප් රත්නායක මහතා - සිතාර්**



**මහින්ද බණ්ඩාර මහතා - ගිටාර්**



- ගී අනුවාදනයක් ඉදිරිපත් කිරීමේ දී සැළකිළිමත් විය යුතු කරුණු.

  - වයන වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව් අනුව හැසිරවිය යුතුය.
  - ස්වර ස්ථාන නිවැරදිව වාදනය කළ යුතුය.
  - වාද්‍ය භාණ්ඩයට අදාළ සුවිශේෂ ශිල්පක්‍රම දැන භාවිතා කළ යුතුය.
  - මනා පුහුණුව, ස්වර ප්‍රස්තාර කියවීමේ හැකියාව දියුණු කර ගත යුතුය.
  - තාල අවබෝධය හා ලය පවත්වා ගැනීම ද වැදගත්ය.

ගී අනුවාදන ශ්‍රවණය තුළින්

- සංගීත භාණ්ඩ හඳුනා ගැනීමට හැකිය
- ශිල්පීය කුසලතා සංවර්ධනයට
- ගීතය නම් කිරීමට හැකිය
- විවේකය ඵලදායීව ගත කිරීමට හැකි වීම
- මානසික තත්ත්වයන් දියුණු කොට සිත සැහැල්ලු කර ගැනීමට හැකි වීම

සුවිශේෂයි :-

- ඔබ කැමති සංගීත භාණ්ඩයක් තෝරාගෙන ගී අනුවාදනයක් ශ්‍රවණය කරන්න.
- එය ශ්‍රවණය කිරීමෙන් පසුව ඉහත කරුණු ද හොඳින් කියවා පැවරුම කරන්න.

**<u>පැවරුම</u>**

1. ගී අනුවාදනයක් යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.
2. ගී අනුවාදනයක් ශ්‍රවණයේ දී ගීතයේ කොටස් අනුපිළිවෙළ සකසා ලියන්න. (අතුරු වාදන Interlude, පෙර වාදන Introduction, ස්ථායී Chords, අන්තරා Verse)
3. පහත දැක්වෙන සංගීත භාණ්ඩ වාදනයෙහි ඉතා ප්‍රකට වූ ශ්‍රී ලාංකේය වාද්‍ය ශිල්පීන් නම් කරන්න.
    - බටනළා
    - ගිටාර්
    - සිතාර්
    - වයලින්
4. ගී අනුවාදනයක් සාර්ථකව ඉදිරිපත් කිරීමට නම් අනුගමනය කළ යුතු කරුණු කිහිපයක් නම් කරන්න.
5. ගී අනුවාදනය තුළින් අපගේ ජීවිතයට ලැබෙන ප්‍රයෝජන මොනවාද?
6. පහත වගුව පුරවන්න.

| | ගීතයේ මුල් පාදය | ගී අනු වාදනය වයන භාණ්ඩයේ නම | තෝරාගත් ගීතයට භාණ්ඩයේ හඬ ගැළපීම | වාදනය පිළිබඳ ඔබට සිතෙන දේ ඔබේ වචනයෙන් ලියන්න |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |